ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**දේශීය ඩොලර් බැඳුම්කර**

(එක්සත් ජනපද ඩොලර්වලින් නාමනය කරන ලද)

නිකුතුව සඳහා වන වෙන්දේසිය

රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**ලංසු ඉදිරිපත් කිරීම:** 2026 ඔක්තෝම්බර් මස 19 වැනි දින පෙ.ව. 09.00 සිට
2026 ඔක්තෝම්බර් 23 වැනි දින ප.ව. 12.00 දක්වා

**පියවීමේ දිනය:** 2026 ඔක්තෝම්බර් 30 වැනි දින

| | |
|---|---|
| **මුදල් වර්ගය** | එක්සත් ජනපද ඩොලර් |
| **නිකුතුවේ ප්‍රමාණය* සහ පරිණත වීම දක්වා කාල සීමාව** | වසර 1, වසර 2, වසර 3 වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 100 |
| **පොලී අනුපාතිකය** | තරඟකාරී ලංසු ක්‍රමවේදය ඔස්සේ සියලු කල්පිරුනු බැඳුම්කර සඳහා නිශ්චය කරනු ලබන ස්ථාවර අනුපාතිකය |
| **පොලී ගෙවීම** | අර්ධ-වාර්ෂික වශයෙනි (අප්‍රේල් 30 සහ ඔක්තෝම්බර් 30) |
| **ආයෝජනය** | අවම වශයෙන් එ.ජ.ඩො. 10,000 සහ එ.ජ.ඩො. 10,000 හි ගුණිතයන්ගෙන් |
| **පැවරීම** | ඉල්ලීම මත, භාරදීම හා ලියාපදිංචි කිරීම මඟින් |

**සුදුසුකම්ලත් ආයෝජකයන් ****

- විදේශ රාජ්‍යවල පුරවැසියන් සඳහා ආමුඛ ආයෝජන ගිණුම් (IIAs) ඔස්සේ
- ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා ආමුඛ ආයෝජන ගිණුම් ඔස්සේ
- පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් හිමියන්, හෝ අක්වෙරළ බැංකු කටයුතුවලට අදාළ ගිණුම් හිමියන්
- ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කර ඇති හවුල්කාරිත්වයන් ආමුඛ ආයෝජන ගිණුම් ඔස්සේ
- මෙරට අරමුදල්, කලාපීය අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල් හෝ ඒකක භාර, සහ ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපනය කර ඇති ආයතනික ආයෝජකයන් ආමුඛ ආයෝජන ගිණුම් (IIAs) ඔස්සේ
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් අලෙවිකරුවන් (ADs) ලෙස පත්කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු
- විදේශ ව්‍යවහාර මුදල්වලින් නාමනය කරන ලද තැන්පතු භාරගැනීම සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු හා මූල්‍ය සමාගම්

| | |
|---|---|
| **බදු** | ශ්‍රී ලංකාව තුළ අදාළ වන බදු නීතිවලට යටත්ව |
| **නිකුත් කරන කාර්යාලය** | රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය<br>මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| **බලාත්මක නීතිය** | ශ්‍රී ලංකාවේ නීති |

ඉදිරිපත් කිරීමේ ලේඛනයේ ඇමුණුම II හි දක්වා ඇති (https://www.treasury.gov.lk/web/domestic-dollar-bond-issuances/section/2026) ආකෘතිය පරිදි වූ අයදුම්පත්, අදාළ නියමිත කාලසීමාව තුළ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ, 3 වැනි මහලේ අංක 330 දරන කාමරයේ තැන්පත් කර ඇති අයදුම්පත් භාරගැනීමේ පෙට්ටිය වෙත පහත ලැයිස්තුවේ දක්වා ඇති නම් කරන ලද අනුයෝජිතයකු හරහා ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත භාරගැනීමේ නිවේදනයට අදාළව දේශීය ඩොලර් බැඳුම්කර සඳහා වන ගෙවීම 2026 ඔක්තෝම්බර් මස 30 වැනි දින පැය 11:00 (නිව්යෝක් වේලාව) දක්වා හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

නම් කරන ලද නියෝජිතයන්ගේ ලැයිස්තුව

ලංකා බැංකුව, දුරකතන:+94-112439566, කැපිටල් එලයන්ස් පීඑල්සී, දුරකතන:+94-112317759, සිටි බැන්ක්, එන්.ඒ.කළඹුව, දුරකතන:+94-117794700, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී, දුරකතන:+94-112486327, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී, දුරකතන:+94-112442335, ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී, දුරකතන:+94-112639884, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, දුරකතන:+94-112664850, එච්එන්බී සිකියුරිටීස් ලිමිටඩ්, දුරකතන:+94-112206297, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක්, දුරකතන:+94-1124313120, එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ්, දුරකතන:+94-112425011, මහජන බැංකුව, දුරකතන:+94-113741866, සම්පත් බැන්ක් පීඑල්සී, දුරකතන:+94-112305480, සෙලාන් බැන්ක් පීඑල්සී, දුරකතන:+94-112456315, යූනියන් බැන්ක් ඔෆ් කළඹුව, දුරකතන:+94-1123744189, වෙල්ත්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී, දුරකතන: +94-112675095

* හිතකර වෙළඳපොළ ප්‍රතිචාරය මත, නිකුතුව අතිරේක දෙගුණයක ප්‍රමාණයකින් වැඩිකිරීමේ හැකියාව පවතී.

** කොන්දේසි අදාළ වේ: ඇමරිකා එක්සත් ජනපදය හෝ එක්සත් ජනපද පුරවැසියන් වෙත මෙම නිකුතුව අදාළ නොවේ.

https://www.treasury.gov.lk. වෙබ් අඩවියේ ඇති 2026 අගෝස්තු 12 දිනැති ඉදිරිපත් කිරීමේ ලේඛනයේ සියලු නියමයන් හා කොන්දේසි දක්වා තිබේ.


උදේනි උඩුගහපත්තුව
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය
කොළඹ 01

දුරකතන: +94-112274341-5
විද්‍යුත් තැපැල් ලිපිනය: dbu@pdmo.gov.lk
වෙබ් අඩවිය: https://www.treasury.gov.lk/web/public-debt-management-office/